පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2018/13(ii)

මගේ අංකය - එන්සීපී/සීඑස්/පීටී/එෆ්ආර්/05/07
පළාත් භාණ්ඩාගාරය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.
2025.12. 02

උතුරු මැද පළාත් සභාවේ සියළුම ලේකම්වරුන් හා,
ව්‍යාවස්ථාපිත අධිකාරී ආයතන ප්‍රධානීන් වෙත.

**උතුරු මැද පළාත් සභාවේ ව්‍යාවස්ථාපිත අධිකාරී ආයතනවල නිලධාරින්ට ප්‍රවාහන පහසුකම්**

2025.09.03 දිනැති අංක 2018/13(i) දරණ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය මගින් සංශෝධිත උක්ත හිසින් යුතු 2018.04.17 දිනැතිව නිකුත්කර ඇති අංක 2018/13 දරණ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ 02 වන ජේදය නැවත පහත දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ.

" 02 ප්‍රවාහන දීමනා

උතුරු මැද පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය, සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය යන ආයතනවල සභාපතිවරුන්ට/ කළමණාකරණ අධ්‍යක්ෂවරුන්ට හා සාමාන්‍යාධිකාරිවරුන්ට අනුයුක්ත කළ වාහන හෝ සංචිත වාහන ප්‍රවාහන කටයුතු සඳහා යොදා නොගන්නේ නම් පමණක්, තම පෞද්ගලික වාහන රාජකාරී ගමන් සඳහා යොදවා ගැනීම වෙනුවෙන් මාසිකව රු.50,000.00 ක ප්‍රවාහන දීමනාවක් ගෙවිය හැකි වේ. කර්මාන්ත සංවර්ධන අධිකාරිය හා මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය යන ආයතනවල සභාපතිවරුන්ට පමණක් සංචිත වාහන හෝ අනුයුක්ත කල වාහන තම රාජකාරී ගමන් සඳහා යොදා නොගන්නේ නම් පමණක් රාජකාරී සඳහා තම පෞද්ගලික වාහනය යොදාගැනීම වෙනුවෙන් මාසිකව රු.50,000.00 ක ප්‍රවාහන දීමනාවක් ගෙවිය හැකි වේ."

02. එම චක්‍රලේඛයේ අනෙකුත් විධිවිධාන නොවෙනස්ව පවතින අතර මෙම සංශෝධනය 2025.09.01 දින සිට බලපැවැත් වේ.

ජේ.එම්.ආර්.පී.ජයසිංහ,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත

පිටපත්.

01. විගණකාධිපති - දැ.පි.
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, උතුරු මැද පළාත - දැ.පි.